**විසර්ජන ශීර්ෂය : 156 යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව හා ආයතනය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2011 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

I කොටස - අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ හා ආයතනයේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

II කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව හා ආයතනයේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ආයතනය**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව |
| - | ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය |

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.8,608,010,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 7,025,536,569 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ඉතිරිවීම් පිළිවෙලින් රු.1,375,304,417 ක් හා රු. 207,169,014 ක් වශයෙන් එකතුව රු. 1,582,473,431ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 19 ක් හා සියයට 16 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 156 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 2,555,445,000 | 4,753,755,000 | 2,470,712,217 | 3,463,183,366 | 84,732,783 | 1,290,571,634 |
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 1,015,427,000 | 283,383,000 | 999,174,600 | 92,466,386 | 16,252,400 | 190,916,614 |
| | එකතුව | 3,570,872,000 | 5,037,138,000 | 3,469,886,817 | 3,555,649,752 | 100,985,183 | 1,481,488,248 |

(ආ) අතිරේක ප්‍රතිපාදන

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 22 ක් වෙත ලබා දුන් එකතුව රු. 29,572,700 ක් වූ ප්‍රතිපාදනවලින් රු. 27,981,834 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ii) වෙනත් ආයතන වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කළ ආයතන 10 කට රු. 4,510,270,000 ක ප්‍රතිපාදනලබා දී තිබුණු අතර ඒවායේ උපයෝජනය රු. 3,998,488,041 ක් විය. ඉතිරිය රු. 511,781,959 කි.

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### (අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 156 | 15601 | 23,550,000 | 19,259,509 | 8,800,000 | 16,728,127 | 85,000,000 | 63,978,724 |
| 215 | 21501 | 65,700,000 | 60,226,646 | 42.000,000 | 61,040,738 | 280,000,000 | 200,260,193 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත 2011 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල රු.4,333,922 ක් වූ හර ශේෂ තිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2011 දෙසැම්බර් 31 දිනට හර ශේෂය |
|---|---|
| | රු. |
| යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 4,249,002 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 84,920 |
| එකතුව | 4,333,922 |

ඉහත රු. 4,249,002 ක් වූ අමාත්‍යාංශ අග්‍රිම ශේෂය 2012 මාර්තු අවසාන වන විට ද, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ රු. 84,920 ක් වූ අග්‍රිම ශේෂය 2012 ජනවාරි 23 දින දී ද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පියවා තිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම්

-------------------------

2011 දෙසැම්බර් 31දිනට අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු. 50,093,534 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2011 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|---|
| ----------------------------------------- | -------------- | ----------------- |
| | | රු. |
| යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0066 /000 | 25,407,732 |
| - එම - | 6000/0000/00/0015/0042 /000 | 7,379,430 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0096 /000 | 17,306,372 |
| | | -------------- |
| එකතුව | | 50,093.534 |
| | | ========= |

**11 කොටස**

**-------------**

**එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව**

**------------------------------------------------------------**

1. **විසර්ජන ශීර්ෂය 156 - යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

**--------------------------------------------------------------------------------**

1.1 විගණන විෂය පථය

----------------------

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 සැප්තැම්බර් 05 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණන සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දෙකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

-------------------------------------------------------------

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

--------------------

(i) වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු රු. 7,310,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 43 ක ප්‍රතිපාදන ඉතිරිවීම් රු. 35,072 සිට රු. 485,776,775 දක්වා එනම් සියයට 25 සිට සියයට 94 දක්වා වූ පරාසයක පැවැතිණි.

(iii) වැය විෂයයන් 06 ක සම්පූර්ණ ප්‍රතිපාදනය වූ රු. 39,025,000 ක් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(iv) වැය විෂයයන් 06 ක පැවැති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ.66 මගින් රු.18,509,898 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද වර්ෂය අවසානයේ දී එම වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉතිරිවීම් රු. 11,616,277 ක් හෙවත් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 63 ක් වී තිබුණි.

(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තා

--------------------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව හා 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402 (1) ප්‍රකාර සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2011 දෙසැම්බර් 13 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි. කෙසේ නමුත් මුල් මාස 08 හි කාර්ය සාධනය පමණක් එම වාර්තාවට ඇතුළත්ව තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---------------------------------------------------------------------------

(i) විෂය අංක 15601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාර එදිනට අයවීමට හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 661,859 ක් වූ අතර , එම හිඟහිටි ශේෂ අය කර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) විශ්‍රාමික නිලධාරීන්ගේ උප ලේඛණයේ සඳහන් කළ යුතු රු. 172,407 ක ණය ශේෂ 02 ක් කේවළ ශේෂ ලැයිස්තුවේ සඳහන් කර තිබුණි.

1.4 වත්කම් කළමනාකරණය

------------------------------

(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

---------------------------------------------

අමාත්‍යාංශය සතු මෝටර් රථ 03 ක් වර්ෂ කිහිපයකට පෙර ක්‍රීඩා අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි.

(ආ) තොග ඌනතා

-----------------

ජාතික යොවුන් සේනාංකය සතු හෙයියන්තුඩුව ගබඩාවේ රු. 78,540 ක තොග ඌනතාවක් විය.

(ඇ) නිශ්කාර්ය තොග

--------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ජාතික යොවුන් සේනාංකය විසින් පුහුණුලාභීන්ගේ නිල ඇඳුමේ ආකෘතිය වරින් වර වෙනස් කිරීමත්, අවශ්‍යතාව පිළිබඳ හොඳින් අධ්‍යයනය කර මිල දී නොගැනීමත් නිසා නිල ඇඳුම් හා රෙදිපිළි ඒකක 3513 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට හෙයියන්තුඩුව ගබඩාවේ නිෂ්කාර්යව පැවැති අතර වෙනත් ස්ථානයක පැවැති පැරණි කළිසම් 3423 ක් ද 2011 නොවැම්බර් මස දී එම ගබඩාවට එවා තිබුණි.

(ii) 2007 ජූලි මස ශේෂව පැවැති නිකුත් කිරීම් සඳහා ජාතික යොවුන් සේනාංකය විසින් මිල දී ගත් විවිධ භාණ්ඩ ඒකක 2048 කින් 2011 ජනවාරි වන විට ඒකක 146 ක් පමණක් නිකුත් කර තිබුණි.

1.5 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | ජනාධිපති ලේකම් චක්‍රලේඛ | | |
| | (i) | අංක පීඑස්ඒ/පී1/40 දරන හා 2007 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ (111) ඡේදය | 2,367,270 | විවිධ වැඩසටහන් හෝටල්වල පවත්වා අමාත්‍යාංශය විසින් රු. 1,596,070 ක් ද, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් රු. 771,200 ක් ද සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි. |
| | (ii) | අංක සීඒ/1/17/1 දරන හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3.1 උප ඡේදය | - | අමාත්‍යවරයාට හා නියෝජ්‍ය අමාත්‍යවරයාට වෙන් කරනු ලබන නිල වාහන සංඛ්‍යාව 03 බැගින් විය යුතු වුව ද, ඊට අතිරේකව අමාත්‍යවරයා හා නියෝජ්‍ය අමාත්‍යවරයා සඳහා පිළිවෙලින් වාහන 11 ක් හා 08 ක් අනුයුක්ත කර තිබුණි. |
| (ආ) | | මුදල් රෙගුලාසි | | |
| | | මු.රෙ. 94 | 2,205,632 | වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළැඹ තිබුණි. |
| (ඇ) | | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |

| | | |
|---|---|---|
| 2.9.1. මාර්ගෝපදේශය | 272,898 | ජාතික යොවුන් සේනාංකය විසින් ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් 10 දෙනෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| | 578,500 | තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් වාර ගණන පදනම ලෙස ගෙන ගෙවීම් නොකිරීම නිසා රු. 578,500ක් වැඩිපුර ගෙවා තිබුණි. |

1.6 කාර්යසාධනය

------------------

සිසුන් 550 ක සහභාගීත්වයක් අපේක්ෂා කරමින්, සමාලෝචිත වර්ෂය තුල ජාතික යොවුන් සේනාංකය විසින් හෝටල් පුහුණු පාඨමාලාවක් ආරම්භ කර ඒ සඳහා රු. 8,753,292 ක උපකරණ මිල දී ගෙන තිබුණි. කෙසේ නමුත්, සිසුන් 421 ක් පමණක් ලියාපදිංචි වී තිබුණු නමුත් පාඨමාලා නිම කර සහතික පත් ලබා ගත් සංඛ්‍යාව 296 දෙනෙකු විය.

1.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

අමාත්‍යාංශය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය.නියැදි පරීක්ෂණවල දී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

ජාතික යොවුන් සේනාංකයේ පුහුණු මධ්‍යස්ථානවලට 2010 වර්ෂය සඳහා ආහාර සැපයීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවක දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණු සැපයුම්කරුවන් 05 දෙනෙකු වෙත එකතුව රු. 63,254,400 ක ප්‍රසම්පාදන පිරිනමා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව පුහුණු මධ්‍යස්ථාන සියල්ල එක් ප්‍රසම්පාදනයක් ලෙස නොසැලකීම නිසා ප්‍රසම්පාදන අත් පොතේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව එකතුව රු. 400,935,000 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් සහිත මෙම ප්‍රසම්පාදනය අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

1.8 අවිධිමත් ගනුදෙනු

---------------------

ජාතික යොවුන් සේනාංකයේ යෞවන පෞරුෂාභිමාන රාත්‍රිය වැඩසටහන සඳහා වූ වියදම් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර විගණනය වෙත වාර්තා වූ පරිදි මෙම වැඩසටහන සඳහා රු. 3,939,062 ක් වැය කර තිබුණි. එම වියදම තුල රු. 2,634,272 ක භාණ්ඩ හා සේවා, ප්‍රසම්පාදන රෙගුලාසි අනුගමනය කිරීමකින් තොරව මිල දී ගෙන තිබුණි.

1.9 අනාර්ථික ගනුදෙනු

----------------------

ජාතික යොවුන් සේනාංකය විසින් සරඹ උපදේශකවරුන් ලෙස 2011 මැයි මස පත්වීම් ලබා දුන් නිලධාරීන් 31දෙනෙකු යොදවා ගෙන තූර්ය වාදන කණ්ඩායමක් පිහිටුවා ඔවුන්ට අවශ්‍ය උපකරණ හා ඇඳුම් පැලැඳුම් ද, 2011 වර්ෂයේ මාස 05 ක් සඳහා පමණක් වැටුප් හා දීමනා ද වශයෙන් එකතුව රු. 4,520,320 ක් වැය කර තිබුණි. ඊට අතිරේකව අවස්ථා 06 ක තූර්ය වාදන කටයුතු වෙනුවෙන් රු. 403,500 ක් දීමනා ද ගෙවා තිබුණි. මෙම නිලධාරීන්ගේ දෛනික පැමිණීමේ වාර්තාවල අධීක්ෂණ නිලධාරියකුගේ සහතික කිරීමක් නොතිබුණි.

1.10 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණය සඳහා ජාතික යොවුන් සේනාංකය විසින් රු. 3,408,363 ක් වැය කර තිබුණ ද, වැය ඇස්තමේන්තු සකස් කර රේඛීය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මෙය වාර්ෂික ක්‍රියාකාරී සැලැසුමට ඇතුළත් ව්‍යාපෘතියක් ද නොවීය.

(ආ) නිලධාරීන් 04 දෙනෙකුගේ සේවය අවසන් කිරීමකට එරෙහිව ඔවුන් විසින් ගම්පහ කම්කරු විනිශ්චය සභාවේ පවරන ලද නඩුවක තීන්දුව මත රු. 1,272,000 ක් එම සභාවේ තැන්පත් කිරීමට ද, එම තීන්දුවට එරෙහිව ගම්පහ මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට රු. 18,400 ක් ද වැය කිරීමට ජාතික යොවුන් සේනාංකයට සිදු වී තිබුණි.

1.11 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

1.11.1 අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

(අ) 2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

(i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 50 | 32 | 18 |
| තෘතියක මට්ටම | 67 | 61 | 06 |
| ද්විතියක මට්ටම | 457 | 340 | 117 |
| ප්‍රාථමික මට්ටම | 70 | 56 | 14 |
| වෙනත් (ආදේශක) | 05 | 02 | 03 |
| එකතුව | 649 | 491 | 158 |

(ii) ජාතික යොවුන් සේනාංකය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 10 | 07 | 03 | - |
| මාණ්ඩලික නොවන | 309 | 267 | 42 | - |
| වෙනත් (කොන්ත්‍රාත්, ද්විතීයන හා දෛනික පදනම) | 205 | 244 | - | 39 |
| එකතුව | 524 | 518 | 45 | 39 |

(ආ) ජාතික යොවුන් සේනාංකයේ කාර්ය මණ්ඩලය පිළිබඳව කරන ලද නියැදි විගණන පරීක්ෂණවල දී පහත පරිදි සේවක පුරප්පාඩු පැවැති අවස්ථා නිරීක්ෂණය විය.

(i) දොම්පේ පුහුණු මධ්‍යස්ථානය 2010 අගෝස්තු සිට වසා දමා තිබුණු නමුත් එදින සිට 2011 අගෝස්තු වන තුරුත් එහි රැඳී සිටි නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු. 727,636 ක් ගෙවා තිබුණි.

(ii) ජාතික යොවුන් සේනාංකයට අවශ්‍ය මානව සම්පත් රේඛීය අමාත්‍යාංශය මඟින් ඍජුව බඳවා ගැනීම වෙනුවට එය සී/ස තරුණ සේවා සමාගමට පැවැරීම නිසා මාස 07 ක් වෙනුවෙන් පමණක් රු. 1,792,374 ක් ආයතනික ගාස්තු ලෙස එම සමාගම වෙත ගෙවා තිබුණි.

1.11.2 අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

-----------------------------------------------------------------------------

1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් පරිදි රාජ්‍ය ව්‍යවසායන්ගේ සම්පත්, අමාත්‍යාංශය විසින් ප්‍රයෝජනයට නොගත යුතු වුවද, රාජ්‍ය ව්‍යවසායන් 05 ක සේවයේ නියුතුව සිටින සේවකයින් 18 දෙනෙකු අමාත්‍යාංශ රාජකාරි සඳහා අනුයුක්ත කර ගෙන තිබුණි. ජාතික තරුණ සේවා සභාවෙන් ලද තොරතුරු අනුව පමණක් අමාත්‍යාංශයට අනුයුක්ත කළ සේවකයින් වෙනුවෙන් 2011 වර්ෂය තුල වැටුප් සඳහා රු. 1,373,425 ක් එම ආයතනය විසින් ගෙවා තිබුණු නමුත් ඒවා අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කර හෝ නොතිබුණි.

## 2. **විසර්ජන ශීර්ෂය : 215 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

**------------------------------------------------------------------------------------------**

### 2.1 විගණන විෂය පථය

---------------------

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 ජූනි මස 27 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දෙකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

--------------------------------------------------------------

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------------

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
| --- | --- |
| බැරකම් ලේඛනය | මු.රෙ. 214 |
| පරිගණක උපාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ආ) අයවැය විචලනය

--------------------

වැය විෂයයන් 15 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 සිට සියයට 86 දක්වා වූ පරාසයක පැවැතිණි.

(ඇ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැසුම

---------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැසුම 2011 දෙසැම්බර් 31 දින වන විට පිළියෙල කර තිබුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුම

-------------------------

2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක කාලය ඉකුත් වූ රු. 6,171,253 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. 571 විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-------------------------------------------------------------------------

විෂය අංක 21501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාර එදිනට අයවීමට හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 6,526,052 ක් වූ අතර , එම හිඟහිටි ශේෂ අය කර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

2.4 වත්කම් කළමනාකරණය

------------------------------

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

යන්ත්‍ර සූත්‍ර 126 ක් හා වෙනත් වත්කම් 21 ක් පිළිවෙලින් වර්ෂ 04 ක හා 05 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවැති අතර ගොඩනැගිලි 03 ක් 2011 දෙසැම්බර් 31 දින වන විට ඌන උපයෝජිතව පැවැති අතර අදාල කාල පරිච්ඡේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

-----------------------------------------------------------------

තාක්ෂණ/කාර්මික විද්‍යාල 21 ක පිහිටි භූමි ප්‍රමාණය අක්කර 266 රූඩ් 02 පර්චස් 24 ක් එම විද්‍යාලවලට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අමාත්‍යාංශය 03ක් සතුව තිබුණු වාහන 06ක් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

2.5 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------ | -------------------- |
| (අ) | ආයතන සංග්‍රහය<br>------------------- | |
| | XII වැනි පරිච්ඡේදයේ 14.4 උප වගන්තිය හා XV වැනි පරිච්ඡේදය | අධ්‍යාපන තාක්ෂණවේදී උපාධි පාඨමාලාව අතරමග දී හැර ගිය උපදේශකවරුන් 04 දෙනෙකු වෙනුවෙන් වැය කළ රු.556,700ක් ගිවිසුම් ප්‍රකාර අය කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>--------------------------- | |
| | 2006 මැයි 30 දිනැති අංක 9/2006 දරන චක්‍රලේඛය | මෙම චක්‍රලේඛයට අදාල පරිදි අධ්‍යක්ෂ ජනරාල් විසින් වරින්වර නිකුත් කර තිබුණු චක්‍රලේඛ ලිපි මගින් කාර්මික විද්‍යාලයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්යාල වේලාව පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා වී තිබුණි. එසේ පැමිණීම සටහන් නොකර දේශකවරුන් වැටුප් ලබා ගෙන තිබුණි. |

2.6 කාර්යසාධනය

----------------

2011 වාර්ෂික ඇස්තමේන්තු අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම, සංයුක්ත සැලැසුමට අනුකූල නොවීම

------------------------------------------------------------------------

2008-2012 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැසුමේ 2011 වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම්, එම වර්ෂයේ ක්‍රියාකාරී සැලැසුම සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සංයුක්ත සැලැසුමට සමගාමීව වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම පිළියෙල කර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැසුමට අනුකූලව ක්‍රියා නොකිරීම

--------------------------------------------------------------

2011 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 279.15 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, 2011 දෙසැම්බර් 31 දින වන විට ඉන් වැය කර තිබුණේ රු. මිලියන 92.45 ක් පමණි.

(ඈ) තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල කාර්ය සාධනය

-----------------------------------------------------

(i) විද්‍යාල 03 ක හා 19 ක පිළිවෙලින් 2007-2010 හා 2008-2009 වර්ෂවල විභාග ප්‍රතිඵල අනුව, එම විභාග සඳහා සහභාගි වූ සිසුන් 6118 දෙනෙකුගෙන් 4,822 දෙනෙකු එනම් සියයට 79 ක් අසමත් වී තිබුණි.

(ii) නියැදි පරීක්ෂාවකට අනුව, පාඨමාලා 10 ක් සඳහා 2007, 2008,2009 හා 2010 වර්ෂවල දී විභාගයට ඉදිරිපත් වූ සිසුන් 927 දෙනෙකුගෙන් 886 දෙනෙකුම අසමත් වී තිබුණි.

(iii) කාර්මික විද්‍යාල 20 ක ගැසට් කරන ලද පාඨමාලා 304 කින් පාඨමාලා 147 ක් පවත්වා නොතිබුණි.

(ඇ) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05, 06 විභාග ප්‍රතිඵල ඇගයීම හා පාඨමාලා පැවැත්වීම

-----------------------------------------------------------------------------------------------

(i) තාක්ෂණ විද්‍යාල 07 ක 2009 හා 2010 වර්ෂවල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05, 06 ලිඛිත පරීක්ෂණ සඳහා පෙනී සිටි සිසුන් 365 දෙනෙකුගෙන් 172 දෙනෙකු විභාගය අසමත්ව සිටි අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 47 ක් විය. එමෙන්ම, 2011 වර්ෂයේ දී සිසුන් 390 දෙනෙකු පෙනී සිටි නමුත් ඉන් 275 දෙනෙකු අසමත්ව සිටීම නිසා අසමත් වීමේ ප්‍රතිශතය සියයට 71 ක් දක්වා වැඩි වී තිබුණි.

(ii) මරදාන තාක්ෂණ විද්‍යාලයේ ජීව වෛද්‍ය ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා වෙනුවෙන් කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් රු. 87,802,162 ක් වටිනා උපකරණ 2008 වර්ෂයේ දී ලබා දී තිබුණි. එම පාඨමාලාව (NVQ 05) සඳහා 2009 හා 2010 වර්ෂවල පිළිවෙලින් සිසුන් 31 ක් හා 20 ක් ලියාපදිංචි වී තිබුණ ද, ඔවුන්ගෙන් ඉතිරිව සිටි පිළිවෙලින් 04 දෙනෙකු හා 14 දෙනෙකු වෙනුවෙන් 2011 දෙසැම්බර් වන විට ද දේශන සම්පූර්ණ කර විභාග පවත්වා නොතිබුණි.

(ඉ) 2009 හා 2010 වර්ෂවල ඇස්තමේන්තු කළ ශිෂ්‍යාධාර හා දෛනික ශිෂ්‍ය දීමනා පිළිවෙලින් රු. 19,000,000 හා රු. 11,700,000 ක් වූ නමුත් ඒවායින් පිළිවෙලින් රු. 7,698,514 ක් හා රු. 2,829,715 ක් ඉතිරි වී තිබුණි. එය ඒ ඒ වර්ෂවල ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 40.51 ක් හා සියයට 24.18 ක් විය.

2.7 අක්‍රීය බැංකු ගිණුම්

----------------------

එක් කාර්මික විද්‍යාලයක බැංකු ගිණුමක් වසර 06 ක කාලයක් අක්‍රීයව පැවැති අතර 2011 දෙසැම්බර් 31 දිනට එහි රු. 828,436 ක ශේෂයක් විය.

2.8 පාඩු හා හානි

---------------

සමාලෝචිත වර්ෂය තුල දී වාහන අනතුරු 03කින් රු. 134,375 ක අලාභ සිදු වී තිබුණු අතර නියමිත කාල සීමාව තුල දී බිල් පත් නොගෙවීමේ හේතුවෙන් රු. 4,060 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි.

2.9 අනාර්ථික ගනුදෙනු

-----------------------

2009 අගෝස්තු 19 හා 24 දෙ දින පැවැති ජාත්‍යන්තර වෘත්තීය අධ්‍යාපන හා පුහුණු කිරීමේ සම්මේලනය (IVETA) වෙනුවෙන් අන්තර් ජාල පහසුකම් ලබා ගෙන තිබුණි. එම සමුළුව අවසන් වී වර්ෂයක කාලයක් ගත වූ පසුව ද, 2010 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව රු. 56,576 ක බිල් පත් පියවා තිබුණි.

2.10 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පහත සඳහන් විගණන ඡේද, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් පසු කළ නිර්දේශ බලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමේ දී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරිණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ රැස්වීමේ දිනය | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | | | |
| 2005 | 5.1 | ණය ශේෂ | 2010.08.19 | ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කිරීම |

(ආ) 2011 අගෝස්තු මස කාර්මික විද්‍යාලවල පවත්වන ලද විභාගයේ දී ජාතික තාක්ෂණික සහතික ප්‍රමාණ සමීක්ෂණ පූර්ණකාලීන (දිවා) පාඨමාලාවේ විෂය අංක 646 ඇස්තමේන්තු හා පිරිවැය පළමු ප්‍රශ්ණ පත්‍රයේ දෙවැනි ප්‍රශ්නයේ I හා II කොටසට එකම ප්‍රශ්නය මුද්‍රණය කර තිබුණි.

(ඇ) සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් තහවුරු කර ගැනීමට ගැසට් පත්‍රයේ iv ඡේදයට අනුව ලියාපදිංචිය සඳහා තෝරා ගනු ලබන්නේ අදාල තාක්ෂණ විද්‍යාලයේ/ කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ/විදුහල්පතිවරයා විසින් කැඳවන ලද සම්මුඛ පරීක්ෂණයකින් පසුව බව සඳහන් වුවත්, සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් තහවුරු කර ගැනීමට අදාල සාක්ෂි නොතිබුණි.

1.11 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

-------------------------------------------

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1205 | 444 | 761 | |
| තෘතික මට්ටම | 40 | 10 | 30 | |
| ද්විතික මට්ටම | 1343 | 941 | 402 | |
| ප්‍රාථමික මට්ටම | 981 | 896 | 85 | |
| වෙනත් (ආදේශක) | - | 03 | - | 03 |
| එකතුව | 3569 | 2294 | 1278 | 03 |

1.12 අභ්‍යන්තර පාලනය

-----------------------

(අ) අභ්‍යන්තර විගණනය

------------------------

මු.රෙ. 134(2) හා 1998 අගෝස්තු 03 දිනැති අංක අයිඒඅයි/98/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) විගණන හා කළමනාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල දී අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් විධිමත්ව පවත්වා තිබුණු අතර කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ විදුහල්පතිවරයා වෙත 2012 නොවැම්බර් 14 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ

ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

(අ) කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල දෝෂ නිවැරදි කිරීම සඳහා යෙදූ ජර්නල් සටහන් ගැලපීමෙන් පසු ලබා ගත් ශේෂය, අවසාන මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් හා සමාන විය යුතු වුවත්, ගිණුම් විෂයයන් 11 ක රු. 903,107 ක නොසැසඳුණු වෙනසක් පැවැතිණි.

(ආ) නිසි පරිදි ජර්නල් සටහන් යොදා නොතිබීම නිසා ලෙජරයේ සටහන් කර තිබුණු රු. 64,127,930 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් ශේෂ පිරික්සුම හා අවසාන මූල්‍ය ප්‍රකාශන සමග එකඟ කළ නොහැකි විය.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ අවසාන මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා එදිනට පිළියෙල කර තිබුණු ශේෂ පිරික්සුම සමඟ එකඟ කළ නොහැකි අවස්ථා පැවැතිණි.

(ඈ) විවිධ රටවලින් ආයතනවලින් හා පුද්ගලයින්ගෙන් පරිත්‍යාග ලෙස ලැබුණු වාහන 06ක් පොත්පත් 1080ක් හා විවිධ උපකරණ 91ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබිණි. ඒවායින් ඒකක 55ක පමණක් ගණනය කළ වටිනාකම රු. 565,500 ක් විය.

2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පනත් | |
| 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත මගින් සංශෝධිත එම පනතේ 26(අ) වගන්තිය | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීම සඳහා සැපයීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු එකතු කළ අගය මත බද්දෙන් සියයට 33 1/3 ක් වූ රු 101,430 ක් රඳවා ගෙන නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ | |
| (i) 1999 ඔක්තොබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.1.6 (v) උප ඡේදය | පාලක මණ්ඩලයේ හා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියක් රහිතව නිවස හා කාර්යාලය අතර ගමන් කිරීමට ආයතනයේ ප්‍රධාන ඉංජිනේරු වෙත වෑන් රථයක් ලබා දී තිබුණි. ඔහු විශ්‍රාම යන තෙක් මාස 21 ක් මෙම රථය භාවිතා කර තිබුණි. |
| (ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| • 9.2 උප ඡේදය | සංවිධාන සටහන හා සේවක සංඛ්‍යාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබිණි. |
| • 9.8.2 උප ඡේදය | කාර්ය මණ්ඩල දිරි දීමනා සඳහා රු.920,390ක් ගෙවා තිබුණු නමුත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

3 මූල්‍ය සමාලෝචනය

------------------------

මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 13,181,942 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාව රු. 44,070,519 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.,30,888,577 ක හිතකර වර්ධනයට, ඉකුත් වර්ෂයේ දී රු. 13,583,739 ක අභාවිත තොග විකුණුම් අලාභයක් පැන නැගීමත්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව පාරිතෝෂිත දීමනා වෙන්කිරීම රු. 24,216,326 කින් අඩු වී තිබීම හා මෙහෙයුම් ආදායම රු. 4,313,263 කින් වැඩි වී තිබීම යන කරුණු විශේෂයෙන් බල පා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කාර්යසාධනය

-----------------

ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට වූ කාර්ය සාධනය ඉකුත් වර්ෂ කිහිපයක කාර්ය සාධනය සමඟ සසඳා පහත දැක්වේ.

| පාඨමාලාව | සිසුන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2011 | 2010 | 2009 | 2008 |
| **පූර්ණ කාලීන පාඨමාලා** | | | | |
| පැවැත් වූ පාඨමාලා සංඛ්‍යාව | 09 | 09 | 09 | 09 |
| පාඨමාලා සඳහා අයදුම් කළ සංඛ්‍යාව | 1848 | 1922 | 2033 | 2335 |
| පාඨමාලා සඳහා ඇතුළත් කර ගත් සංඛ්‍යාව | 406 | 341 | 334 | 364 |
| අතර මග දී පාඨමාලා හැර ගිය සංඛ්‍යාව | 09 | 14 | 20 | 30 |
| පාඨමාලා අවසානයේ විභාගයට පෙනී සිටිසංඛ්‍යාව | 284 | 316 | 329 | 267 |
| සමත් වූ සංඛ්‍යාව | 248 | 265 | 280 | 242 |
| අසමත් වූ සංඛ්‍යාව | 36 | 51 | 49 | 25 |

අර්ධ කාලීන පාඨමාලා

--------------------------

| | | | | |
|---|---|---|---|---|
| ඇතුළත් වූ සංඛ්‍යාව | 2716 | 2427 | 2412 | 2491 |
| පාඨමාලාව අවසන් කළ සංඛ්‍යාව | 1802 | 1781 | 1675 | 1715 |
| අතර මග දී පාඨමාලා හැර ගිය සංඛ්‍යාව | 469 | 283 | 281 | 273 |

බොරැල්ල ශාඛාව

---------------------

පූර්ණ කාලීන පාඨමාලා

---------------------------

| | | | | |
|---|---|---|---|---|
| පැවැත් වූ පාඨමාලා සංඛ්‍යාව | 02 | 01 | 01 | - |
| පාඨමාලා සඳහා ඇතුළත් කර ගත් සංඛ්‍යාව | 50 | 18 | 15 | - |
| අතර මග දී පාඨමාලා හැර ගිය සංඛ්‍යාව | විස්තර නැත. | 06 | 03 | - |
| පාඨමාලා අවසානයේ විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | විස්තර නැත. | 09 | 12 | - |

අර්ධ කාලීන පාඨමාලා

--------------------------

| | | | | |
|---|---|---|---|---|
| පැවැත් වූ පාඨමාලා සංඛ්‍යාව | 02 | - | - | - |
| පාඨමාලා හදාරන සංඛ්‍යාව | 64 | - | - | - |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පූර්ණ කාලීන පාඨමාලා සඳහා අයදුම් කරන සිසුන් සංඛ්‍යාවේ අනුක්‍රමික අඩුවීමක් පෙන්නුම් කෙරේ.

(ආ) බොරැල්ල ශාඛාවේ සිසුන් 100 කට අධ්‍යයන පහසුකම් පවතින නමුත් එය සම්පූර්ණ වී නොතිබුණි. කෙසේ වුවත්, බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාවේ ප්‍රගතියක් නිරීක්ෂණය විය.

(ඇ) අර්ධ කාලීන පාඨමාලා 06 ක් වෙනුවෙන් බඳවා ගත් අතිරික්ත සිසුන් සංඛ්‍යාව සියයට 38 සිට සියයට 70 දක්වා පරාසයක විය. මේ නිසා ආවරණය විය යුතු ප්‍රායෝගික පුහුණු කාල සීමාවේ හා ගුණාත්මකභාවයේ හීනවීමක් සිදු නොවන්නේ නම්, බඳවා ගත හැකි සිසුන් සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත හැකිව තිබුණි.

(ඈ) 2011 මුල් අර්ධ වර්ෂයේ මුළු පාඨමාලා ආදායමින් සියයට 83 ක් ඒ සඳහා වූ කාර්ය මණ්ඩලයේ දීමනා වෙනුවෙන් වැය කර තිබුණි.

4.2 අවිධිමත් ගනුදෙනු

---------------------

(අ) ආධුනික සිසුන් සඳහා මාසිකව ගෙවනු ලබන රු.1,000 ක දීමනාවෙන් වර්ෂයකට රු.275 ක් අයකර පුහුණු කාලය තුල දී සිදු වන අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ආධුනික රක්ෂණ අරමුදල පිහිටුවා තිබුණු අතර ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දින වන විට එහි රු. 1,751,403 ක ශේෂයක් පැවැති නමුත් 2010 හා 2011වර්ෂවල දී අනතුරු කිසිවක් සිදු වී නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන ස්ථාවර තැන්පතුවල රු. 20,495,318 ක් ආයෝජනය කර තිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

----------------------------

2005 වර්ෂයට පෙර සිට පැවැත එන නමුත් මේ දක්වාමත් නිරවුල් නොකළ රු. 8,013,111 ක ණය ශේෂ 03 ක් පැවැතිණි.

4.4 අනාර්ථික වියදම්

--------------------

2011 බක් මහ උළෙල වෙනුවෙන් රේඩියෝ අමාත්‍යාංශයේ සුභසාධන අරමුදලට රු. 50,000 ක් පාඨමාලා ආදායමින් ගෙවා තිබුණි.

05. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

----------------------------------------

අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර වූ විචලනයන් සලකා බැලීමේ දී වියදම් විෂයයන් 03 ක අයවැයගත වියදමින් සියයට 32 ක් පමණක් වර්ෂය තුල වැය කර තිබුණු හෙයින් අයවැය ලේඛණය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

06. පද්ධති හා පාලනය

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර ආයතනයේ විදුහල්පතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) සේවක බඳවා ගැනීම්

(ඇ) ණයගැතියෝ